# දැන්වීමයි.

## බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ
## ආයුර්වේද සේවා සහායක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම
## (බාහිර බඳවා ගැනීම)

බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද සේවා සහායක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** වැටුප් පරිමාණය :
ඒකාබද්ධ වැටුප - **PL-01-2016**
රු. **24,250 -10x250 – 10x270 – 10x300 - 12×330 - රු. 36,410/-**

**02.** බඳවා ගැනීමේ සුදුසුකම් :

අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් **(06)**සමත් වී තිබිය යුතු අතර,ඉන් විෂයයන් **(5**ක්) එකවර සමත්ව තිබීම.

කායික සුදුසුකම්:

i. සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්,ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම්:

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර **03**ක් අඛණ්ඩ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

**03.** වෙනත් :
අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු **18** ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි විය යුතුය.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් **2019.09.24** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

**04.** බඳවා ගැනීමේ ක්‍රමවේදය
සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ව්‍යුහගත පරීක්ෂණයෙන් **40%** වඩා ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.